**වැලිමඩ ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 24 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 16 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 23 දිනද ,සභාපතිවරයාට යවා ඇත.

### 1.2. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුද්දර ගාස්තු රු.30,854,990 ක් වුවද,මූල්‍ය ප්‍රකාශනවල රු.30,883,321 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මගින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.179,900 ක විදුලි ජෙනරේටරය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මගින් නිවැරදි කරමි. |

### 1.4 අනුකූල නොවීම්

**නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාවට අයත් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, කඩ කාමර 154 ක කුලී අයකිරීමේදී තක්සේරු නොකර කුලී අය කර තිබුණි. | තක්සේරු කර කුලී අය කරගත යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ලිපි යොමු කර ඇති නමුත් තක්සේරු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු අයකරන දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, 2010 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදීද බදු අය කර තිබුණි. | තක්සේරු යාවත්කාලීන කර බදු අය කරගත යුතුවේ. | දේපළ සම්බන්ධ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව ඉල්ලීම් කර ඇති නමුත් තක්සේරු කර නොමැත. |
| (ඇ) | ගෝසාතකාගාර පනත හා 1980 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රය | ගෝසාතක ආඥා පනතේ 07 (2) වගන්තිය අනුව ගෝසාතකාගාර 03 කට අදාලව කරන ලද ඉල්ලීම් පිළිබඳ විස්තර ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුවේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |
| (ඈ) | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පණතේ 23 'අ' වගන්තිය | සභාව විසින් අවසර දී ඇති ගෝසාතකාගාර 3 ක් වෙනුවෙන් 2018 සහ 2019 වර්ෂ සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුවේ. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.48,516,115 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,722,945 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 3,461,186 | 3,461,186 | 3,322,570 | 138,616 | 3,384,634 | 3,384,634 | 2,224,551 | 1,160,083 |
| ii | කුලී | 18,436,323 | 18,436,323 | 16,148,314 | 2,288,009 | 18,780,074 | 18,780,074 | 17,392,668 | 1,387,405 |
| iii | බලපත්‍ර ගාස්තු | 3,038,000 | 3,174,366 | 3,174,366 | - | 2,417,400 | 2,852,875 | 2,852,875 | - |
| iv | වෙනත් ආදායම් | 42,737,851 | 42,737,851 | 59,072,158 | - | 33,951,070 | 33,951,070 | 11,875,438 | 22,075,632 |
| | එකතුව | 67,673,360 | 67,809,726 | 81,717,408 | 2,426,625 | 58,533,178 | 58,968,653 | 34,345,532 | 24,623,120 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි වරිපනම් රු.3,383,466 ක් හා හිඟ හිටි වෙනත් ආදායම් රු.68,445,625 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අය කරගත යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.13,515,721 සහ හිඟ මුද්දර ගාස්තු රු.30,883,321 අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අය කරගත යුතුවේ. | උපලේඛන සකස් කර අදාල දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් අදාල ගාස්තු වලින් කොටසක් පමණක් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සම්බන්ධයෙන් ගැටළු කීපයක් පැන නැගුන බව හා ඒවා නිරාකරණය කර ගැනීමෙන් පසුව පිළියෙල කිරීමට කටයුතු කරමි. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යායපත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | රාජ්‍ය බැංකු ශාඛාවක් පවත්වාගෙන යන සභාවට අයත් ඉඩම වෙනුවෙන් නව තක්සේරු වාර්තාව මත පදනම්ව බදු කුලී අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව රු.1,443,753 ක පාඩුවක් සිදුවී තිබුණි. | නව තක්සේරු මත බදුකුලී අයකර ගත යුතුවේ. | අදාල ආයතනය මුදල් ගෙවීමට එකඟවී ඇති බව හා නව ගිවිසුම් සකස් කර පළාත් පාලන ආයතනයට යවා ඇත. |
| (ආ) | වසර 05කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණය හිමියෝ රු.24,554,596 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | වියදම් ණයහිමියෝ කොටසක් මේවනවිට පියවා ඇති බව හා ඉතිරිය ප්‍රතිපාදන ලද පසු පියවීමට කටයුතු කරමි. |

## 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 03 කට අදාලව සේවක අතිරික්ත 06 ක් සහ තනතුරු 06 කට අදාලව පුරප්පාඩු 14 ක් පැවතුනි. | අතිරික්ත හා පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල කටයුතු කළ යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට ඉල්ලීම් කර ඇති අතර, සියලු බඳවාගැනීම් නැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයකින් දන්වා ඇති බැවින් තනතුරු පුරප්පාඩු සපුරාලිය නොහැකි වේ. |

**3.4 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොමැත. |

**4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>**

**4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | චක්‍රලේඛ උපදෙස් අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විමට කටයුතු කරමි. |